**රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල - 2018**

**----------------------------------------------------**

**තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.4 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.1 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------------

මෙම වාර්තාවේ 1.4 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.3 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.4 මූල්‍ය ප්‍රකාශන

### 1.4.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ගනුදෙනු ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදි ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.4.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක -01 | | |
| (අ) අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව පිළියෙල කර ඇති බව වාර්තා කර තිබුණද, ප්‍රමිතියට පටහැනි ලෙස දෙපාර්තමේන්තුව විසින් පනවන ලද දණ්ඩන හා රාජසන්තක කිරීම් ආදායම් මුදල් පදනමට ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කර තිබුණි. | රේගු දෙපාර්තමේන්තුවේ විවිධ අංශවල ක්‍රියාත්මකවන සංකීර්ණ කාර්යභාරයන් තුළ ත්‍යාග අරමුදලට අදාළව ගිණුම සකස් කිරීමේදී එම කටයුතු ආරම්භ කරනු ලබන්නේ මුදල් අංශය වෙත රේගු විමර්ශන අවසන් කර අදාළ ත්‍යාග ලිපිගොනු ලැබීමෙන් පසුවය. එහිදී එක් එක් ත්‍යාග | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ගිණුම් පිළියෙල කර ඇති බව වාර්තාකර ඇති හෙයින් උපචිත පදනම අනුගමනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු බව. |

| | | |
|---|---|---|
| | ගොනුවට අදාළ මුදල් ගෙවිය යුතු ප්‍රමාණය ගෙවන ලද ප්‍රමාණ පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබයි. ත්‍යාග ගොනුවක් සකස් කර එයට අදාළ ගෙවීම් කිරීම බොහෝ විට එම ගොනුව සකස් කළ මූල්‍ය වර්ෂය තුළදීම සිදු නොවන බැවින්, කිසියම් වර්ෂයක් තුළ ආදායම් ලෙස ගිණුම් ගත කළ යුතු වටිනාකම වඩා නිවැරදිව පෙන්නුම් කිරීමට මෙම ක්‍රමවේදය තුළ හැකිය. | |
| (ආ) ප්‍රමිතියේ 21 (ඇ) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් සමඟ ඉදිරිපත් කළ යුතු සංරචකයන් අතරින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය එක් සංරචකයක් වුවත් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුළ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වෙනුවට අරමුදල් ලැබීම් හා ගෙවීම් පිළිබඳ ප්‍රකාශනයක් ඉදිරිපත් කර තිබුණි. | විගණන නිරීක්ෂණය නිවැරදිය. මෙම අරමුදල සඳහා වෙනම මුදල් පොතක් හා ලෙජර ගිණුමක් පවත්වාගෙන නොයන බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් පිළියෙල කිරීම අපහසුය. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු බව. |

### 1.4.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට විමර්ශන කටයුතු අවසන්ව තිබූ සිද්ධි ලිපිගොනු 91 කට අදාලව කොටස් වශයෙන් අය කරගෙන තිබූ රු.671,975,900 ක මුදලින් රේගු ත්‍යාග අරමුදල සඳහා වූ සියයට 50 ක දායකය වූ රු.335,987,950 ක මුදල ගිණුම්වලින් අත්හැරී තිබුණි. | මෙම අරමුදලට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සිදු කරන්නේ මුදල් අංශයේ පවතින ත්‍යාග ලේඛන හා තොරතුරු පදනම් කරගෙනය. විගණනය විසින් සඳහන් කර ඇති තොරතුරු මුදල් අංශයේ පවතින ලේඛන අනුව සොයා ගත නොහැකි අතර, එම තොරතුරු ලබාගත් මූලාශ්‍ර සොයා බලා ඒවායේ නිවැරදිතාවය පිළිබඳව සම්පූර්ණ තහවුරුවක් ලබාගත හැකි නම් එම වටිනාකමද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට ඇති හැකියාව සොයා බලමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව වාර්තා කර ඇති හෙයින් උපචිත පදනම මත ගිණුම් සැකසිය යුතු බව. |

| | | |
|---|---|---|
| (ආ) විධිවිධාන ප්‍රකාරව දණ්ඩන හා විකුණුම් ආදායමින් රේගු ත්‍යාග අරමුදල සඳහා සියයට 50 ක්ද, කළමනාකරණ හා වන්දි අරමුදල සඳහා සියයට 20 ක්ද වශයෙන් දායක විය යුතු විය. එහෙත් කළමනාකරණ හා වන්දි අරමුදල සඳහා ආදායම් ලෙස හඳුනාගෙන තිබූ රු.884,904,677 ට සමානුපාතිකව ත්‍යාග අරමුදලේ ආදායම් රු.2,212,261,692 ක් විය යුතු නමුත් අවසාන ගිණුමෙහි ආදායම් ලෙස රු.2,462,038,890 ක් හඳුනාගෙන තිබුණි. එම වෙනස සඳහා හේතු පැහැදිලි නොකෙරුණි. | රේගු දණ්ඩන හා රාජසන්තක කරන ලද භාණ්ඩ විකුණන ආදායම් හඳුනාගන්නා ආකාරය ගිණුම් ප්‍රකාශනවල දක්වා ඇත. | එකම ආදායම් ප්‍රභවයක් මත පිහිටා පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශන අතර ආදායමේ සමානුපාතික තත්ත්වයක් තිබිය යුතු බව. |
| (ඇ) විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වියදම ඉක්ම වූ ආදායම රු.122,898,009 ක් ලෙස දක්වා තිබුණද, මෙය වියදම් ඉක්ම වූ ආදායමක් නොවන බවත් තවදුරටත් ත්‍යාග අරමුදලේ උප අරමුදල් සඳහා මුදල් නොගෙවීම හේතුවෙන් ඇති වූ ශේෂයක් බවත් නිරීක්ෂණය වේ. | ත්‍යාග අරමුදලට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එම අස්ථිත්වයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුරූපීව රු.122,898,009 ක මුදල වියදම ඉක්ම වූ ආදායමකි. වියදම ඉක්ම වූ ආදායම හඳුනාගැනීමෙන් අනතුරුව විසර්ජනයන් යටතේ වෙනත් උප අරමුදල්වලට මුදල් වෙන් කිරීම සිදුවන බැවින් ත්‍යාග අරමුදල යටතේ රු.122,898,009 ක මුදල වියදම ඉක්මවූ ආදායමක් යන්න අපගේ අදහස වේ. | වර්ෂය තුළදී ලැබෙන සියළුම මුදල් නිසි පරිදි ත්‍යාග මුදල් ලැබීමට නියමිත පාර්ශවයන්ට ගෙවීමෙන් හා අවශ්‍ය ගැලපීම් සිදුකිරීමෙන් පසු අතිරික්තයක් ඇති වන්නේ නම් එය විසර්ජනය කළ ආකාරය මූල්‍ය ප්‍රකාශන සමඟ අනාවරණය කළ යුතු බව. |

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| 1968 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තිය | ත්‍යාග අරමුදලින් ත්‍යාග මුදල් බෙදා හැරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කල යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් රේගු ත්‍යාග මුදල් බෙදා හැරීම සඳහා නිකුත් කර තිබූ 1988 ජනවාරි 28 දින අංක පීඑල් 118 දරන දෙපාර්තමේන්තු නියෝගය සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඇති බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. කෙසේ වුවද, 1999 වසරේ සිට 2018 වර්ෂය දක්වා වර්ෂ 20 ක් තුළ ත්‍යාග මුදල් ලෙස රු.මිලියන 16,007.5 ක් ගෙවා තිබුණි. | විගණන නිරීක්ෂණ සමග එකඟ වෙමි. ත්‍යාග මුදල් ගෙවීම සම්බන්ධව 1968 අංක 17 දරන රේගු ආඥා පනතේ 153(2) (ආ) වගන්තිය අදාල වේ. 1988 වර්ෂයේ අංක 118 දරන දෙපාර්තමේන්තු නියෝගය නිකුත් කිරීමේදී අවශ්‍ය අනුමැතිය ලබාගෙන එය නිකුත් කර ඇතැයි යන්න උපකල්පනය කළ හැකි අතර, තවදුරටත් මේ සම්බන්ධයෙන් සොයා බැලිය යුතුවේ. | 1968 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තිය ප්‍රකාරව ත්‍යාග මුදල් බෙදාහැරීම වෙනුවෙන් සකසන ක්‍රමවේදය සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ලබා ඇති බවට තහවුරු කරගෙන ගෙවීම් කල යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.122,898,009 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.25,457,489 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.97,440,520 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට දණ්ඩන ආදායම රු. 142,882,565 කින් වැඩිවීම හා රේගු නිලධාරීන් සඳහා දණ්ඩන ගෙවීම රු.23,009,730 කින් අඩුවීමත්, ඔත්තුකරුවන් සඳහා ගෙවීම රු.127,874,978 කින් වැඩි වීමත්, උපඅරමුදල් සඳහා වෙන් කළ මුදල් නොගෙවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) රේගු වැරදි සම්බන්ධව සිදු කරන රේගු විමර්ශනවලදී සාමාන්‍ය ක්‍රමයට ආනයනයන් මත රජයට ලැබිය යුතු අවම බදු ආදායමේ ප්‍රමාණය අයකර ගැනීම පිළිබඳ නොසලකා එම අහිමි වූ ආදායමද ඇතුළත් වන පරිදි රේගු වැරදි සම්බන්ධයෙන් දඩ පැනවීමත් එසේ පනවන දණ්ඩන මුදලින් සියයට 50 ක් නිලධාරීන්ට ත්‍යාග ගෙවීමට යෝජනා වීමත් තුළින් රජයට ලැබිය යුතුව තිබූ ආදායම අඩු වීමත්, නිලධාරීන් වෙත බෙදාහරින ත්‍යාග මුදල්වල ප්‍රමාණය වැඩි වීමත් නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් වැඩිදුර නිරීක්ෂණ පහත දැක්වේ.<br><br>(i) වර්තමානයේ පවත්නා නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හේතුවෙන් ආනයනයන්ගේ හා අපනයනයන්ගේ ඇති වී ඇති සංකීර්ණතාවයට ගැලපෙන අයුරින් රේගු ආඥා පනත මෙන්ම මෙම අරමුදල්වල නෛතික ප්‍රතිපාදන විධිමත්ව හා කාලීනව සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය විගණනයේදී නිරීක්ෂණය කෙරේ. | රේගු වරදක් මගින් දණ්ඩනයක් පැනවීමට හැකියාවක් ලැබෙන්නේ එම වරද අනාවරණය කර ගැනීමට නිලධාරීන් සූක්ෂම වී කටයුතු කරන නිසාය. එසේ සූක්ෂම වී යම් වරදක් අනාවරණය කර ගැනීමට නොහැකි වන අවස්ථාවන්හිදී එම සිද්ධියට අදාළ මුළු ආදායම රජයට අහිමි වේ. නමුත් නිලධාරීන්ගේ දක්ෂතාවය මත එම රේගු වැරදි අල්ලා ගැනීමට හැකිවීම තුළ එකතු කරගන්නා මුදලින් සියයට 30 ක මුදලක් රජයට ලැබෙන නිසා රජයේ ආදායමට යම් ප්‍රමාණාත්මක දායකත්වයක් ලැබෙන අතරම නිලධාරීන් රේගු වැරදි අල්ලා ගැනීමට ඇති වන පෙළඹවීමද ඉහළ මට්ටමක පවත්වා ගැනීමට හැකිවේ. | රේගු ආඥා පනත මේ වන විට වසර 51 ක් පමණ පැරණි වන අතර එම කාලය තුළදී තිබූ ආනයන අපනයන තත්ත්වයන් මත මෙම පනත පිළියෙල කර තිබුණද එය වර්තමාන ආනයන අපනයන තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් පනත වර්තමාන තත්ත්වයට අනුකූල වන පරිදි පිළියෙල කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ii) මෙම අරමුදල යටතේ ත්‍යාග ගෙවීම සඳහා යෝජිත රේගු විමර්ශන බොහෝමයක්,<br>• භාණ්ඩවල වටිනාකම අඩුවෙන් දැක්වීම<br>• නියමිත භාණ්ඩ වර්ගීකරණ අංකය (HS CODE) වැරදි ලෙස දැක්වීම<br>• ප්‍රකාශ නොකළ භාණ්ඩ රැගෙන ඒම<br>• ප්‍රකාශ කළ භාණ්ඩවලට වඩා වැඩිපුර භාණ්ඩ රැගෙන ඒම<br>• ප්‍රකාශ කළ භාණ්ඩ වෙනුවට වෙනත් භාණ්ඩ රැගෙන ඒම<br>• ශ්‍රී ලංකාවට ආනයනය තහනම් කළ භාණ්ඩ ආනයනය කිරීම හා අපනයනය තහනම් කළ භාණ්ඩ අපනයනය කිරීම<br>• ප්‍රකාශ නොකළ මුදල් දිවයිනට රැගෙන ඒම සහ රැගෙන යාම | ගැලපෙන අයුරින් රේගු ආඥා පනත සහ අරමුදල්වල නෛතික ප්‍රතිපාදන වරින්වර සංශෝධනය වී ඇති අතර, ඉදිරියේදී ද අදාළ පරිදි සංශෝධනය කිරීම පිළිබඳව අවධානය යොමුකරනු ලැබේ. | රේගු ආඥා පනත මේ වන විට වසර 51 ක් පමණ පැරණි වන අතර එම කාලය තුළදී තිබූ ආනයන අපනයන තත්ත්වයන් මත මෙම පනත පිළියෙල කර තිබුණද එය වර්තමාන ආනයන අපනයන තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් පනත වර්තමාන තත්ත්වයට අනුකූල වන පරිදි පිළියෙල කළ යුතු වීම. |
| යනාදී රේගු වැරදි සම්බන්ධයෙන් සිදුකර ඇති ඒවා බව නිරීක්ෂණය විය. එවැනි රේගු වැරදි වැළක්වීම සඳහා ශ්‍රී ලංකා රේගුව තුළ ස්ථාවර වැටුප් ලබන නිලධාරීන් සියලුම අංශ සඳහා යොදවා තිබියදී අඛණ්ඩව පවතින මෙවැනි රේගු වැරදි තුළින් රාජ්‍ය ආදායමට සිදුවන අහිතකර බලපෑම පාලනය කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග මේ දක්වා ගෙන ඇති බවක් නිරීක්ෂණය නොවීය. | රේගු වැරදි පාලනය කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන ඇති බව නිරීක්ෂණය කරන අතර අඛණ්ඩව විවිධ පුද්ගලයින් විසින් කරන වැරදි නැවැත්වීම අසීරු බව නිරීක්ෂණය කරමි. | රේගු ආඥා පනත මේ වන විට වසර 51 ක් පමණ පැරණි වන අතර එම කාලය තුළදී තිබූ ආනයන අපනයන තත්ත්වයන් මත මෙම පනත පිළියෙල කර තිබුණද එය වර්තමාන ආනයන අපනයන තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් පනත වර්තමාන තත්ත්වයට අනුකූල වන පරිදි පිළියෙල කළ යුතු වීම. |

(ආ) විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට යොමු කරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශයන් |
|---|---|---|---|
| (i) ගිණුම්කරණය | විධිමත් පරිදි ලෙජර් ගිණුම් පද්ධතියක් පවත්වා ගෙන යාමට කටයුතු කර නොතිබීම හා උපචිත පදනම මත ගිණුම් පිළියෙල නොකිරීම. | දෛනිකව විශාල ගනුදෙනු ප්‍රමාණයක් සිදුවන බැවින්ද රේගු වරදවල්වලට අදාළ අවසන් තීරණ ගෙන සිද්ධිය අවසන් කිරීමට විශාල කාලයක් ගතවීම සහ ත්‍යාග ගොනු සකස් කිරීමට හා ගෙවීමට විශාල කාලයක් ගතවීම නිසා උපචිත පදනමට මූලා ප්‍රකාශන | පවතින පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව අවධානය යොමු කොට ක්‍රමවත් පාලන පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | පිළියෙල කරනවාට වඩා තාත්විකභාවයක් දැනට පිළියෙල කරන ක්‍රමවේදය තුළ පෙන්නුම් කරයි. | |
| (ii) ත්‍යාග ගණනය කිරීම | ත්‍යාග මුදල් ගණනය කිරීමේදී රජයේ බදු ආදායම සුරක්ෂිත වන ලෙසටත් , රේගු බදු වංචාවන්වල පාලනයක් ඇති වන ලෙසටත් හා රේගු බදු වංචාවන්වල නිරත පාර්ශවයන්ට උපරිම අවාසියක් ලැබෙන ලෙසටත් වූ ප්‍රායෝගික ගණනය කිරීමේ ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබීම. | රේගු ආඥා පනතේ විධිවිධාන අනුව නිකුත් කර ඇති දෙපාර්තමේන්තු නියෝග අනුව මෙම ගණනය කිරීම් සිදුවන බැවින් මේ සම්බන්ධව තවදුරටත් අධ්‍යයනය කළ යුතුවීම | පවතින පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව අවධානය යොමු කොට ක්‍රමවත් පාලන පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු වීම. |
| (iii) ත්‍යාග ගෙවීම් කිරීම | ගිණුම් අංශය වෙත ත්‍යාග ගොනු ලද අවස්ථාවේදී එම ගොනු ලේඛනගත නොකිරීම හා අනුපිළිවෙල අනුව ගෙවීම් නොකිරීම. | ත්‍යාග ගොනු ලැබෙන දිනය ගොනු අනුපිළිවෙලට තබා ඇති අතර, ප්‍රමුඛතාවය ලබා දෙනු ලබන ගොනු හැර අනෙකුත් ගොනු ලැබෙන අනුපිළිවෙලට ගෙවීම් කරනු ලබයි. | පවතින පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව අවධානය යොමු කොට ක්‍රමවත් පාලන පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු වීම. |

**3.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

**කාර්යසාධනය**

රේගු ආඥා පනතේ 153 (2) (ආ) ඡේදය ප්‍රකාරව විවිධ රේගු වැරදි සඳහා පනවනු ලබන දණ්ඩන මුදල් සහ රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල්වලින් සියයට 50 කට සමාන මුදල් ප්‍රමාණයක් රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලට බැර කරනු ලබන අතර රේගු බදු වංචාවන් අනාවරණය කරගැනීම, පාලනය කිරීම හා වැළැක්වීම වැනි අරමුණු පෙරදැරි කරගෙන නිලධාරීන්ට හා ඔත්තුකරුවන්ට ත්‍යාග ලබාදීම සඳහා මෙම අරමුදල පිහිටුවා තිබේ. 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කරනු ලැබූ ගෙවීම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වර්ෂය | ගෙවන ලද ත්‍යාග ලිපිගොනු සංඛ්‍යාව | ගෙවන ලද මුදල | එක් ලිපිගොනුවකට ගෙවූ මුදල් සාමාන්‍යය |
|---|---|---|---|
| | | රු. | රු. |
| 2012 | 183 | 952,882,430 | 5,207,008 |
| 2013 | 286 | 1,509,280,909 | 5,277,205 |

| | | | |
|---|---|---|---|
| 2014 | 343 | 1,353,531,889 | 3,946,157 |
| 2015 | 274 | 1,252,772,591 | 4,572,163 |
| 2016 | 279 | 2,371,231,289 | 8,499,036 |
| 2017 | 246 | 2,316,128,767 | 9,415,157 |
| 2018 | 266 | 2,462,038,890 | 9,255,785 |

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා එකතුව රු.9,738,686,387 ක මුදලක් නිලධාරීන් හා ඔත්තුකරුවන් අතර බෙදා හැර තිබුණු අතර, මින් රු.8,716,601,093 ක් හෙවත් සියයට 89.50 ක් නිලධාරීන් වෙත ගෙවා තිබුණි. | විගණන නිරීක්ෂණය සමග එකග වෙමි. | නිලධාරීන් සඳහා ත්‍යාග මුදල් ගෙවීමේදී වර්තමාන තත්ත්වයට ගැලපෙන පරිදි සුදුසු ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. |
| (ආ) 2012 වර්ෂයේදී නිලධාරීන්ට හා ඔත්තුකරුවන්ට ගෙවූ මුදල රු.මිලියන 787 ක් පමණක් වුවද, 2018 වන විට එය රු.මිලියන 1,873 ක් දක්වා එනම් සියයට 138 කින් වැඩි වී තිබුණි. එසේම මෙම මුදල් ගෙවා ඇත්තේ ඒ ඒ වර්ෂවලදී විමර්ශන කටයුතු නිම වූ රේගු වැරදි කිහිපයක් සම්බන්ධයෙන් වුවද, විමර්ශන කටයුතු නිම නොවූ සිද්ධි ප්‍රමාණය බෙහෙවින් ඉහළ අගයක් ගෙන තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව රේගු බදු වංචාවන්ගේ සැළකිය යුතු පාලනයක් හෝ අඩුවීමක් ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ සිදුවී ඇති බවක් නිරීක්‍ෂණය නොවේ. | විගණන නිරීක්ෂණය නිවැරදි නොවේ. නිලධාරීන් සූක්ෂමවීම (Vigilant) නිසා ඔවුන් විසින් අනාවරණය කරගත් විමර්ශන සංඛ්‍යාව ඉහළ යාම නිසා නිලධාරීන්ට හා ඔත්තුකරුවන්ට ගෙවූ මුදල් ප්‍රමාණය වැඩි වී ඇත. | නිලධාරීන් සඳහා ත්‍යාග මුදල් ගෙවීමේදී වර්තමාන තත්ත්වයට ගැලපෙන පරිදි සුදුසු ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. |
| (ඇ) ත්‍යාග අරමුදලේ උප අරමුදලක් වන ඉන්ධන අරමුදලට සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 63 ක් බැර කර තිබුණි. එම අරමුදල පිහිටුවීමේ අරමුණ ලෙස රේගු විමර්ශන සඳහා අවශ්‍ය ඉන්ධන වියදම් පියවා ගැනීම බව දක්වා තිබුණ ද, විමර්ශන කටයුතු සඳහා දරන ඉන්ධන පිරිවැය දෙපාර්තමේන්තුවේ පොදු වැය ශිර්ෂයට වැය බරක් වී තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ එම අරමුදලෙන් රු.82,180 ක වියදමක් පමණක් දරා තිබුණි. එසේ වුවද සාධාරණ අවශ්‍යතාවයන් නොසලකා දිගින් දිගටම මෙම අරමුදලට මුදල් රැස්කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට එහි ශේෂය රු.මිලියන 503 ක් වී තිබුණි. | විගණන නිරීක්ෂණය නිවැරදිය. | අරමුදල ඇති කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන විමර්ශන කටයුතු සඳහා දරන ඉන්ධන පිරිවැය දෙපාර්තමේන්තුවේ පොදු වැය ශිර්ෂයට වැය බරක් නොවන පරිදි අරමුදල මගින් ඉන්ධන වියදම් දැරීම |

| | | |
|---|---|---|
| (ඇ) ත්‍යාග අරමුදලේ උප අරමුදලක් වන මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා සහභාගි වන නිලධාරීන් වෙනුවෙන් ගෙවීම් සඳහා වන මත්ද්‍රව්‍ය නිවාරණ අරමුදල (නාකොටික් අරමුදල) සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 22 ක් අරමුදලට බැර කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණේ රු. මිලියන 7 ක් පමණි. | විගණන නිරීක්ෂණය නිවැරදිය. | මත්ද්‍රව්‍ය වැටලීම් විමර්ශන සඳහා සම්බන්ධවන නිලධාරීන් වෙනුවෙන් මත්ද්‍රව්‍ය නිවාරණ අරමුදල මගින් කල යුතු ගෙවීම් විධිමත් හා කාර්යක්ෂම කිරීම. |
| (ඉ) විමර්ශන කටයුතු සඳහා සෘජුව දායක නොවන නමුත් සහායක සේවා සපයන අංශවල නිලධාරීන් සඳහා ගෙවීම් වෙනුවෙන් පිහිටුවා ඇති සියයට 2.5 ක අරමුදල සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 31.5 ක් බැරකර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ ඉන් කිසිදු මුදලක් වැය කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය නිවැරදිය. | රේගු විමර්ශන සඳහා සහය සපයන පාර්ශවයන් සඳහා අදාල ගෙවීම් ප්‍රමාදයකින් තොරව සිදුකිරීම තුළින් ඔවුන්ගේ කාර්යක්ෂමතාවය ඉහළ නංවා ගත හැකි බව. |